ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2017/2018**

අපරාධ නීතිය - **LLU4806/LWU2312**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.02.26 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. " සිද්ධිය පිළිබඳ වැරදීම, පුද්ගලයකු තමා අත් කර ගන්නා ප්‍රතිඵලයන් සාපරාධී ඒවා වන බවට කිසිදු දැනුමක් නොමැතිව ක්‍රියාකර ඇත්තේ වුවද, තමාගේ ම ස්වේච්ඡා හැසිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාපරාධී අනුෂංගයන් උද්ගත කරයි. ..."

(Peiris ,G.L.,*General Principles of Criminal Liability in Ceylon*, Page 48)

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් සිද්ධිය පිළිබඳ වැරදීම රක්ෂණයෙහි සත්‍ය අර්ථය ඉහත ප්‍රකාශයෙන් පිළිබිඹු වන්නේ ද?

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 12)

(ආ) යම් ව්‍යවස්ථාපිත වරදකට එරෙහිව ඉහත සඳහන් විත්තිවාචකය ගෙන ඒමට චූදිත පුද්ගලයකුට හැකි ද?

එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ දණ්ඩන නීතිය තුළ යථාර්ථ වගකීම මූලධර්මයෙහි භාවිතය ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 12 + 08 = 20)

02. තමා ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන යන වෙනත් කාන්තාවක් විවාහ කර ගැනීමේ චේතනාවෙන් තම භාර්යාව වූ දිල්කි මරා දැමීමට සමන් සැලසුම් කළේය. සමන් තම විශ්වාසවන්ත සගයකු වූ චමින්දට තමාගේ සැලසුම පිළිබඳව විස්තර කරමින් එය ක්‍රියාත්මක කිරීමට ඔහුගේ සහාය ඉල්ලා සිටියේය. කාර්යය සම්පූර්ණ වූ විට චමින්දට රු.300,000/- ක මුදලක් ගෙවීමට ද සමන් පොරොන්දු වූයේ ය. වස දීමෙන් දිල්කි මරා දැමීමට චමින්ද යෝජනා කළ අතර වස කුප්පියක් ද ලබා දුන්නේ ය. පසු දින සමන් පළතුරු බීම වීදුරු 2 ක් පිළියෙල කර එක් බීම වීදුරුවකට වස මිශ්‍ර කළේ ය. සෙල්ලම් කරමින් සිටි තම දෙහැවිරිදි දියණිය පසෙක තබාගෙන රූපවාහිනිය නරඹමින් සිටි දිල්කිට වස මිශ්‍රිත බීම වීදුරුව දුන් සමන්, එම කාමරයෙන් පිටවී මිදුලෙහි රැඳී සිටියේ ය. මිනිත්තු කිහිපයකට පසු, දිල්කි උදව් ඉල්ලා කෑ ගසන හඬ ඇසුණු සමන් වහාම ඇය සිටි කාමරය වෙත දිව ගියේ ය. සිහිසුන් ව බිම වැටී සිටි තම දියණිය දැකීමෙන් සමන් කම්පනයට පත් විය. දැරිය වහාම රෝහලට ගෙන ගිය ද ඇතුලත් කරන අවස්ථාවේ ඇය මිය ගියා ය.

පසුව හෙළි වූයේ සමන්ගේ දියණිය, දිල්කිගෙන් වස මිශ්‍රිත බීම වීදුරුව රැගෙන පානය කර ඇති බවයි.

මිනීමැරුම සම්බන්ධයෙන් සමන් ට හා චමින්ද ට චෝදනා නැගී ඇත.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අදාල ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය දක්වමින් ඔවුන්ගේ සාවද්‍යතාව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. ඉදිකිරීම් සමාගමක පුහුණු වන අධීක්ෂක වරයකු වූ ප්‍රමෝද්, එම සමාගමෙහි ම පිළිගැනීමේ නිලධාරිනිය ලෙස සේවය කළ මේනකා සමග සම්බන්ධතාවයක් ඇති කර ගත්තේ ය. එක් සිකුරාදා සන්ධ්‍යාවක, නගරයේ පිහිටි ප්‍රසිද්ධ අවන්හලක රාත්‍රී ආහාර ගැනීම පිණිස යාමට ප්‍රමෝද් මේනකාට ඇරයුම් කළේය. රාත්‍රී ආහාරය ගන්නා අතරතුර එකිනෙකාට ඉතා සමීපව අසුන් ගෙන සිටි මේනකා සහ ප්‍රමොද්ගේ ඡායාරූප ගන්නා ලෙස ප්‍රමෝද් වේටර් වරයකුට පැවසීය. ප්‍රමෝද් එම ඡායාරූප තම ජංගම දූරකථනයේ සුරැකිව තබා ගත්තේය. දින කිහිපයකට පසුව ප්‍රමෝද් සමාගම හැර ගියේය. දිනක් දූරකථනයෙන් මේනකා ඇමතූ ප්‍රමෝද්, වහාම තමාට රු.500,000/- ක මුදලක් ලබාදෙන ලෙස කියා සිටි අතර, තම ඉල්ලීම ඉටු නොකළොත් මේනකා විවාහ ගිවිසගෙන සිටින කෙවින් වෙත එම ඡායාරූප යවන බවට තර්ජනය කළේය. තමා අවමානයට පත් වෙතැයි සහ විවාහ ගිවිසගත් තරුණයා අහිමි වී යතැයි බියෙන්, මේනකා පසුදින තම රන් ආභරණ උකස් කර රු.300,000/- ක මුදලක් ප්‍රමෝද් ට ලබා දුන්නා ය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ කිසියම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ප්‍රමෝද්ට චෝදනා නැගිය හැකි ද?

සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. මුහුදු වෙරළේ පැවති සාදයක් අතරතුර ඇති වූ උණුසුම් වචන හුවමාරුවක දී සිසිර විමල්ට හිස් බෝතලයකින් පහර දුන් අතර, විමල් සිහිසුන් ව වෙරළේ ඇද වැටුණි. විමල්ව විනාශ කර දමන බවට දිවුරමින් සිසිර එතැනින් පිටවී ගියේය. අධික ලෙස මත්පැන් පානය කිරීම නිසා මත් වී සිටි විමල් සහ සිසිරගේ සගයන් දෙදෙනා විමල් ව ඇදගෙන ගොස් මුහුද අද්දර තැබූ හ. පසුව, රාත්‍රී කාලයේ වඩදිය ඇතිවීම හේතුවෙන් විමල් දියේ ගිලුණි. විමල්ගේ මෘත ශරීරය පසුදින උදෑසන සොයා ගන්නා ලදී.

දියේ ගිල්වීමෙන් විමල්ගේ මරණය සිදු කිරීම සම්බන්ධව සිසිරට හා ඔහුගේ සගයන් දෙදෙනාට චෝදනා එල්ල වී ඇත.

කාරණත්ව න්‍යාය කෙරෙහි අවධානය යොමු කරමින් සිසිරගේ සහ ඔහුගේ සගයන් දෙදෙනාගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න. නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබගේ තර්කයන් තහවුරු කරන්න.

(ලකුණු 20)

05. 14 වියැති ගැහැණු ළමයකු වූ හිරුණි ව නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම සම්බනධව සුජිත් ට විරුද්ධව චෝදනා නැගී ඇත. සුජිත් ගේ විත්තියේ නීතිඥවරයා වශයෙන්, පහත දැක්වෙන විත්ති වාචකයන් හි වලංගු භාවය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

(i) තමා සමග රහසේ පැනයාමට එන ලෙස හිරුණි සුජිත් ට ආරාධනා කළ අතර, උපකාරක පන්තියකට යන බව අඟවා නිවසින් පිට වී පන්තියේ දොරටුව අසල දී ඇය සුජිත් ව හමු වූ බව.

(ii) තමාගේ වයස අවුරුදු 18 ක් බව හිරුණි සුජිත්ට අඟවා තිබූ බව.

(iii) සන්ධ්‍යාවේ ඇය ව නිවසට ආපසු යවන අදහස ඇතිව, සුජිත් හිරුණිට ආරාධනා කළේ 'සිටි සෙන්ටර් සිනමා' හි චිත්‍රපටයක් නැරඹීමට යාම සඳහා පමණක් බව.

(ලකුණු 20)

06. පාරිභෝගිකයකු විසින් අමතක වීමකින් මේසයක් මත දමාගිය ටැබ්ලට් පරිගණකයක් 'සිටි රෙස්ටොරන්ට්' අවන්හලේ වේටර් වරයකු වූ චතුර දුටුවේ ය. හසුවනු ඇතැයි යන බිය නිසා එවේලේ ම ටැබ්ලට් පරිගණකය ගැනීමට කටයුතු නොකරමින්, චතුර එය ක්‍රියා විරහිත කර කසල බඳුන පිටුපස සැඟවූවේය. අයිතිකරු විසින් එය කිසිවිටෙකත් සොයා නොගනු ඇතැයි සිතූ ඔහු, තමා සේවය නිම කර පිටවී යන අවස්ථාවේ ටැබ්ලට් පරිගණකය සැඟවූ තැනින් රැගෙන යාමට අදහස් කළේ ය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ චතුර යම්කිසි අපරාධ වරදක් සිදු කර ඇත් ද? සාකච්ඡා කරන්න.

යෝග්‍ය ව්‍යවස්ථාපිත නීතිය සහ නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

07. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් කර ඇති අන්දමට

(අ) දෝෂ මුක්ත ආයාචනයන් සහ ලුහුඬු ආයාචනයන් හි ස්වභාවය හා වෙනස්කම්

සහ

(ආ) මිනී මැරුම වරද සඳහා ඇති ලුහුඬු ආයාචනයන්හි අදාලත්වය

විස්තර කරන්න.

(ලකුණු 10 x 2 = 20)

08. පැරණි රෝම නීතිය යටතේ 'ළදරුභාවය' විත්තිවාචකයේ ප්‍රභවය සාකච්ඡා කරන්න. එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ නූතන අපරාධ නීති සන්දර්භය තුළ එහි භාවිතය සංසන්දනය කරන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.